# මහනුවර අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාවේ කාර්මික උරුමය

කේ.එම්.ඊ. සිල්වා

පුරාවිද්‍යා හා උරුම කළමණාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
eranga123.eds@gmail.com

**ප්‍රමුඛපද:** අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාව, රොටවේන් ඇඹරුම් යන්ත්‍රය, ඕතෝර්ඩොක්ස් ඇඹරුම් යන්ත්‍රය

## හැඳින්වීම

කාර්මික පුරාවිද්‍යාව යනු නුදුරු අතීතයේ ඉසව් , තාක්ෂණික ප්‍රවණතාවයන් පිළිබඳව අධ්‍යනය කරන පුරාවිද්‍යාවේ උප විෂයකි. දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියනු ලබන ශ්‍රී ලංකේය කාර්මික පුරාවිද්‍යාව විෂය පථය අයත් වනුයේ ක්‍රි.ව. 1800-1950 කාලය ඇතුළත් ආදි නූතන අවධියටයි. පූර්ව කාල පරිච්ඡේදයට අයත් කාර්මික ප්‍රවණතාව නිසා ශ්‍රී ලංකාවට අදාළ වූ 'කාර්මික උරුමය" අතර වැවිලි කර්මාන්තය හා බැඳුන ස්ථාන, ස්මාරක හා යන්ත්‍ර සූත්‍ර ප්‍රමුඛ වේ. ශ්‍රී ලංකාවේ තේ වගාවේ මූලාරම්භක අවධියට අයත් වූ මහනුවර අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාව හා ඒ ආශ්‍රිත කාර්මික උරුමය පිළිබඳව අධ්‍යනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.

මහනුවර අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාවේ කාර්මික උරුමය පිළිබඳ පූර්ව අධ්‍යන පිළිබඳව තොරතුරු සෙවීමේ දී ද මෙතෙක් කිසිදු කෙනෙකු ඒ පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යනයන් සිදු කර ඇති බවට වාර්තා නොවේ.

අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාව පිහිටා ඇත්තේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ අංකුඹුර නම් කුඩා නගරයෙහිය. මෙම තේ කර්මාන්ත ශාලාවේ 1946 දී මීසාන් හජ්ජියාර් විසින් මිලට ගෙන ඇත. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් 1974 අගෝස්තු මාසයේ දී රජයට පවරා ගන්නා ලදී. නමුත් 1990 දී නැවතත් මෙම තේ කර්මාන්ත ශාලාව මීසාන් සමාගම යටතට ගැනීමට හැකියාව ලැබුණි. වර්තමානයේ මෙහි අධිපතිත්වය දරන්නේ ඉහිතිශාම් මීසාන් විසිනි.

## ක්‍රමවේදය

මූලික ක්‍රමවේදය ලෙස මෙම අධ්‍යනය සඳහා යොදා ගනු ලැබුවේ ක්ෂේත්‍ර අධ්‍යනයයි. ක්ෂේත්‍ර ගවේෂණයට පිවිසීමට පෙර ක්ෂේත්‍ර නොවන ගවේෂණයක් සිදු කරන ලදී. ඒ අනුව තේ නිෂ්පාදන ක්‍රියාවලිය සහ ඒවාට යොදා ගන්නා යන්ත්‍ර පිළිබඳව මූලික අවබෝධයක් ලබා ගැනීම මෙහිදී සිදුවිය. ඒ අනුව ද්විතියික දත්ත ලබා ගැනීම සඳහා මූලාශ්‍ර අධ්‍යනයක් සිදුකරන ලදී. එසේම අන්තර්ජාලය ඔස්සේ මෙම කර්මාන්ත ශාලාව පිළිබඳව තොරතුරු ලබා ගත් අතර ඡායාරූප ආශ්‍රයෙන් තොරතුරු සෙවීමේ දී ද මෙතෙක් කිසිදු කෙනෙකු ඒ පිළිබඳ පර්යේෂණ සහ අධ්‍යනයන් සිදු කර ඇති බවට වාර්තා නොවේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

තවමත් වර්තමානයේ භාවිතා වන සහ අතීතයේ භාවිතා කළයන්ත්‍ර සහ

උපකරණ මෙම තේ කර්මාන්ත ශාලාවේ දක්නය ලැබේ. ඒ අනුව එම කාර්මික උරුමයන් පහත පරිදි පෙන්වා දිය හැක.

- බිම් තරාදිය

'ක්ෂේත්‍රයේ තේ දලු කැඩීමෙන් පසුවදලුවල ප්‍රමාණවල බර ඒ ස්ථානවලදීම මැනබලනු ලැබේ.එහිදී දලු කූඩයේ හෝ බෑගයෙහි බර හැර දලුවල බර සදහන් කර ගනු ලැබේ. එහිදී දලු කූඩයේ හෝ බෑගයෙහි බර හැර දලු වල බර සදහන් කර ගනු ලැබේ. දෙපසට ඇති තරාදි පියන් ද්වයකින් මෙහි එක් පසෙක තාරාදි පියනට යටින් වූ කොටසට රෝද සවිකර තිබේ. මෙය ඕනෑම දිශාවනට චලනය කළ හැකිය.' ( ද සිල්වා :2005: 128 ) මෙම කර්මාන්ත ශාලාවේ බිම් තරාදි දෙකක් දක්නට ලැබෙන අතර එම බිම් තරාදි දෙකම නිෂ්පාදනය කර ඇත්තේ VANDOME TITIORE AND CO: LIMITED නම් ආයතනය විසිනි . නමුත් එම ආයතනය අයත් රට සදහන් නොවේ. වර්තමානයේදී මෙම බිම් තරාදිය එදිනෙදා කිරුම් මිනුම් සදහා භාවිතයට නොගන්නා අතර මෙය තේ කර්මාන්ත ශාලාවෙම කොටසක ප්‍රදර්ශනය කොට ඇත.

- ඕතොඩොක්ස් ඇඹරුම් යන්ත්‍රය

'මෙය දලු දමන විවරය ,පීඩක පියන , කුටීරය , ඇඹරුම් මේසය , ඇඹරුම් මේසයෙහි මධ්‍ය කොටස හා කුඩු පිට කරන දොරටුව වශයෙන් කොටස් කළ හැකිය. මේ අඹරුම් යන්ත්‍රය වෙතට දලු එවීම සදහා උඩ ු මහලේ සිට ඇඹරුම් යන්ත්‍රය වෙත සුදු දිග රෙදි පටියක් යොදා තිබේ. මැලවීමට ලක්කරන ලද දලු එහි සිට කුහරයට දැමූ විට එය යන්ත්‍රය තුළට ලබාදේ. මෙය දලු යන්ත්‍රයට ඇතුලු කිරීමේ පහසුම ක්‍රමයකි. පීඩන පියන මගින් ඇති කරනු ලබන තෙරපී මහා භ්‍රමණය හේතුවෙන් දලු කොටස 'වලට කැඩීම සිදුවේ. බර ප්‍රමාණ අනුව විවිධ ඇඹරුම් යන්ත්‍ර මගින්තේ දලු කුඩු වීම විවිධ ප්‍රමාණ වලට සිදුවේ.' ( ද සිල්වා :2005:134 ) මෙම යන්ත්‍රයේ නිෂ්පාදන ආයතනයක් ගැන සදහන් නොවන අතර **'cCc'** යනුවෙන් ලාංඡනයක් ඇත.

- රොටවේන් ඇඹරුම් යන්ත්‍රය

'මෙම යන්ත්‍රය සදහා ද දලු ඇතුලු කරන දොරටුවක් , දලු කැබලි ඉදිරියට යවන කොටසක් , කුටීරය , පංකා පෙති ආදි කොටස්ද තේ කුඩු පිට කරන කොටස්ද අන්තර්ගත වේ. මේ යන්ත්‍රයෙහි බාහිර ස්වරූපය ද අභ්‍යන්තර ක්‍රියාකාරිත්වය ද ඕතොඩොක්ස් ඇඹරුම් යන්ත්‍රයෙන් වෙනස් වේ' (ද සිල්වා:2005:136). මෙම යන්ත්‍රය බහුලවම යකඩ භාවිතා කරමින් නිපදවා ඇත. මෙම යන්ත්‍රයේ 'TIVANE' යනුවෙන් නිෂ්පාදන ආයතනය සදහන් කර ඇත.

මීට අමතරව තේ දලු ඇඹරීම සදහා තවත් ඇඹරුම් යන්ත්‍රයක් තිබී ඇති අතර එයද වර්තමානයේ භාවිතයට නොගන්නා අතර එහි නිෂ්පාදන ආයතනය ලෙස 'THE BENTALL AND CO: LTD; ENGLAND" යනුවෙන් සදහන්ව ඇත.

- බල උත්පාදන යන්ත්‍රය

අතීතයේදී මෙම තේ කර්මාන්ත ශාලාව සදහා බලය උත්පාදනය කර ඇත්තේ ඩීසල් භාවිතයෙන් ක්‍රියා කරන බල උත්පාදන යන්ත්‍රයකිනි. මෙම යන්ත්‍රය නිපදවා ඇත්තේ එංගලන්තයේ Crompton Pakinson සමාගම විසිනි.

- බල උත්පාදනයන්ත්‍රයේ කටයුතු සදහායොදා ගන්නා විශාල යතුරු උපකරණ එකතුවක් ද දක්නට ලැබේ. එහි EAGLE BRAND සන්නාමය සදහන් ව ඇත.

- තේ කර්මාන්ත ශාලාවේ සන්නිවේදන කටයුතු සඳහාඑ කල භාවිතා කළපැරණි දුරකතනදෙකක් ද දක්නට ලැබෙන අතර මේවා වර්තමානයේ ප්‍රදර්ශනය සඳහා තබා ඇත.

- එසේම හදිසි තත්ත්වයකදී භාවිත කළ හැකි ගිනි නිවන උපකරණයක් ද දක්නට ලැබේ. එහි නිෂ්පාදන ආයතනය ' THE STREAMLINE FILTER CO: LTD' ලෙස සඳහන්ව ඇත.

මහනුවර අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාවේ කාර්මික උරුමයන් බොහොමයක් දක්නට ලැබේ. ඒ අනුව ආරම්භයේ සිටම පැවති යටත් විජිත බලපෑම මෙමගින් මැනවින් විදහා දැක්වේ. වර්තමානයේ දී මෙහි පැරණි යන්ත්‍ර හා උපකරණ මනාව පිළිවෙළට ප්‍රදර්ශනය සඳහා තබා ඇති අතර කාර්මික උරුමස්ථානයක් ලෙස මහනුවර අංකුඹුර මීසාන් තේ කර්මාන්ත ශාලාව මේ අනුව වැදගත්කමක් උසුලයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ද සිල්වා, ආර්. (2005) ***ශ්‍රී ලංකාවේ තේ ඉතිහාසය.*** සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා ඇල.